# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2086/10 – 2018 අගෝස්තු 27 වැනි සඳුදා – 2018.08.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතලේ පල්ලේසිය පත්තුව සුළු කොට්ඨාසයේ කුරුවාව (ඊ 376 බී) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කුරුවාව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එම්ඒ/ආර්ටීටී/2017/659 හා 2018.01.29 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

**1. කැබලි අක්ෂර 'ඒ' – නෙළුකොස්ගහමුල වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0836 ක් පමණ**

උතුරට: කුමාර හේවාපතිරණ හිමිකම් කියන පල්ලේගෙදර වත්ත සහ එස්. ජී. අයි. ජී. වීරසිංහ හිමිකම් කියන පල්ලේගෙදර වත්ත; නැගෙනහිරට: එස්. ජී. අයි. ජී. වීරසිංහ හිමිකම් කියන පල්ලේගෙදර වත්ත සහ මාර්ගය (ප්‍රා.ස.); දකුණට: ඩබ්ලිව්. කේ. දිසානායක හිමිකම් කියන නෙළුකොස්ගහමුල වත්ත; බටහිරට: යසරත්න සහ තවත් අය හිමිකම් කියන පන්වයාවත්ත, කරුණාරත්න සහ තවත් අය හිමිකම් කියන පන්වයාවත්ත සහ කුමාර හේවාපතිරණ හිමිකම් කියන පල්ලේගෙදර වත්ත.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2017/ඩබ්ලිව්එස්/400.
2018 අගෝස්තු මස 02 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

09 - 240

1A – G28366– 12 (2018/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*